**සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය - 2020**

**-----------------------------------------------**

සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළඹි අංක 3585 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V(ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. (අ) සුළං බලශක්ති උත්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම (ආ) පද්ධති ප්‍රතික්‍රියාශීලී බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ (ඇ) ණය ලබා ගන්නාගේ ව්‍යාපෘති ඉංජිනේරු නිර්මානකරණය සමාලෝචනය සහ අධීක්ෂණ ධාරිතාව සවිබලගැන්වීම මගින් ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්තිය උත්පාදනය වැඩිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,923.06 කට සමාන එජඩො මිලියන 256.70 වන අතර ඉන් රු. මිලියන 31,104.84 කට සමාන එජඩො මිලියන 200 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 8,818.22 කට සමාන එජඩො මිලියන 56.70 ක් මූල්‍යායනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා හා එහි ව්‍යාපෘති වියදම් විස්තරය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු<br>-------- | මුදල<br>-------<br>රු. | කළමනාකරණයේ ප්‍රතිචාර<br>-------------------- | විගණකගේ නිර්දේශ<br>------------- |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු** | 28,64,650 | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් යනු සමුච්චිත ක්ෂය ප්‍රමාණය එහි | වත්කම්වල නියම වටිනාකම දැක්වීමට සම්පූර්ණයෙන්ම |

| | | | | |
|---|---|---|---|---|
| | **වෙනස්වීම සහ වැරදි**<br><br>ව්‍යාපෘතිය විසින් අඛණ්ඩව භාවිත කරමින් පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය ගිණුම්කරණ ප්‍රතිපත්තියේ සඳහන් පරිදි සමාලෝචනය කර නොතිබුණි. උදාහරණයක් ලෙස සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු.28,642,650.61ක පිරිවැය සහිත මෝටර් වාහන පහක් නියම ජීවිත කාලය ඇස්තමේන්තු කිරීමකින් තොරව භාවිත කරමින් පවතී. | | පිරිවැයට සමාන සහ පොත් වටිනාකම 0ට සමාන වත්කම් වේ. ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත ආගණනය කළ යුතු නම් වත්කම්වල පිරිවැයද නැවත ආගණනය කළ යුතු අතර එම වත්කම් කාණ්ඩයට අයත් සියලුම වත්කම් නැවත ආගණනය කිරීමට සිදුවේ.<br>වාහන ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් භාවිත කරන ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීම සඳහා දැනටමත් කමිටුවක් පත්කර ඇති අතර කමිටුවේ නිර්දේශ අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය කිසියම් වෙනස්වීමක් හඳුනා ගතහොත් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ක්ෂය කරන ලද වත්කම් සමාලෝචනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් දිස්ත්‍රික් ලේකම් වෙත තබන ලද රු.40,100,1000ක තැන්පතු ශේෂය නිරවුල් කිරීමකින් තොරව වර්ෂ 4ක් පුරා පැවතුණි. | 40,100,1000 | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පූර්ව අවශ්‍යතාවක් ලෙස ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන ඉඩමේ අපේක්ෂිත වටිනාකමින් 25%ක් තැන්පත් කිරීමක් ලෙස මෙම තැන්පතුව තබා ඇත. මන්නාරම ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරියා විසින් වන්දි ගෙවීමට හැකි බව දැන්වීමෙන් පසු අදාල පරිදි මෙම මුදල සත්‍ය වටිනාකමින් / පිරිනමන ලද වටිනාකමින් අඩු කරනු ලැබේ. වරින් වරට ඉල්ලීම් සිදු කළ ද මන්නාරම් දිස්ත්‍රික් ලේකම් විසින් වන්දි ගෙවන ලද ලැයිස්තුවක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවෙතත්, | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය. |

දිස්ත්‍රික් ලේකම් වෙත නිරවුල් කිරීම් පිළිබඳ විස්තර ඉල්ලීම් සමග සෑම වර්ෂයකම අවසානයේදී මෙම තැම්පතුව සඳහා ශේෂ තහවුරු කිරීම් ඉල්ලා ඇත. එම නිසා මෙම ශේෂ අනෙකුත් තැම්පතු යටතේ පවතින අතර ඉඩම් හිමියන් වෙත නිරවුල් කිරීම් පිළිබඳ විස්තර නොමැතිව ඉවත් කිරීමට හෝ ප්‍රාග්ධනිත කිරීමට නො හැකිය.

**2.2 රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණක බඳවා ගැනීමට හෝ ව්‍යාපෘතියේ ගනුදෙනු ලං.වි.ම අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත්වී නොතිබුණි. | ව්‍යාපෘතියේ ගනුදෙනු සඳහා ලං.වි.ම අභ්‍යන්තර විගණන අංශය මගින් 2017 වර්ෂයේදී සවිස්තරාත්මක අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත. | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් නිරන්තරයෙන් සිදු කළ යුතුය. |
| (ආ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2020 ජුනි 08 දිනැති අංක එස්ඊසී/2020/03(සංශෝධිත) දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ව්‍යාපෘතිය අදාළ නිලධාරීන්ගේ වැටුප් මගින් අඩු කිරීමෙන් තොරව 2020 දෙසැම්බර් 31 දක්වා උපයන විට ගෙවීම් බදු/ උසස් පෞද්ගලික බදු සහ බදු මත බදු රු.මිලියන 15.76ක් ඔවුන්ගේ අරමුදල් මගින් ගෙවා තිබුණි. | 2020 ඔක්තෝබර් දක්වා APIT ලං.වි.ම ගෙවා තිබුණු අතර මණ්ඩලයේ තීරණයට අනුව 2020 නොවැම්බර් මස සිට APIT නිලධාරීන් විසින් දරනු ලැබේ. | උපයන විට ගෙවීම් බදු නිලධාරීන්ගේ වැටුපෙන් අඩු කර ගත යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 23 දිනැති අංක 1/2016 දරන කළමණාකරන සේවා චක්‍රලේඛයේ 4.3 වගන්තිය | වගන්තියට පටහැනිව, ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා 2020 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.මිලියන 23.74ක නිවාඩු දීමනා සහ ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. | මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් සියලු දෙනාටම අදාළ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශවලට අනුව වේ. | ලංකා විදුලිබල මණ්ඩලය චක්‍රලේඛ අවශ්‍යතා අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘති අත්පොතේ වගන්තිය පරිපාලන වීසී(31) | ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් වාර්තා කිරීමට වෙනම මුදල් පොතක් පවත්වා ගැනීම වෙනුවට ව්‍යාපෘති අංශයේ පොදු මුදල් පොත භාවිත කර තිබුණි. | ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් විවෘත කිරීම දීර්ඝ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වේ. එය ව්‍යාපෘතිය ආරම්භක අදියරේදී කළ යුතුව තිබුණි. වර්තමානයේ ව්‍යාපෘතිය අවසාන අදියරේ පැවතින අතර මේ අවස්ථාවේ බැංකු ගිණුමක් විවෘත කිරීම ප්‍රායෝගිකව සිදු කළ නො හැකිය. ව්‍යාපෘතියේ ගණුදෙනු පදනම් කරගෙන වෙනම මුදල් පොතක් වාර්තා කිරීමේ අරමුණින් ලෙජර පද්ධතිය මගින් ලබා ගත හැකිය. | අතේපාතෙහි සඳහන් අවශ්‍යතාවන් පරිදි වෙනම මුදල් පොතක් පවත්වා ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| **සංරචකය** | **2020 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදය/ විගණන ගැටලුව** | **ප්‍රමාදයන් සඳහා හේතු** | **කළමනාකරයේ ප්‍රතිචාර** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|---|---|---|
| | **අපේක්ෂිත කාර්යසාධනය** | **අත්කරගත් කාර්යසාධනය** | | | | |
| | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** | | | | |
| සුළං බල උත්පාදන ධාරිතාවය වැඩි කිරීම | 100 | 87.60 | ආරම්භක නිම කිරීමේ දිනය 2020 දෙසැම්බර් වුවද එය 2021 මාර්තු වන විට නිම කිරීමට අපේක්ෂිත විය. දිගු කාලීන අඩු පිරිවැය උත්පාදන සැලැස්මේ අරමුණු නිසි පරිදි ලඟා කර ගත නො හැකි | පාස්කු ඉරුදින ප්‍රහාරය (2019 අප්‍රේල්) සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සිදු වූ බාධා සහ එහි ප්‍රතිඵලයක් ලෙස කොටුමා උපපොළ සූදානමක් නොමැති වීම. | ආරම්භක කාලසටහනට අනුව, ව්‍යාපෘතියේ අවසන් දිනය 2020 ඔක්තෝබර් 25 වූ අතර පාස්කු ඉරු දින ප්‍රහාරය, ගෝලීය වසංගත තත්ත්වය සහ කොන්ත්‍රාත් ගිවිසුම යටතේ යාන්ත්‍රික කැනීම් නියමිත | අනවශ්‍ය පිරිවැය වළක්වා ගැනීමට සැලසුම් කළ ආකාරයට කටයුතු නිම කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | වේ. | | කාලයට නිම කිරීමට අවශ්‍ය අමතර කොටස් සහ උපකරණ ආනයනයට රජය විසින් පනවන ලද ආනයන සීමා අහිතකර ලෙස බලපෑම හේතුවෙන් කාලය 2021 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, නාඩුකුඩා එකතු කරන උපපොළෙහි සුදානමක් නොමැති වීම නිසා ප්‍රමාදයන්ට හේතු විය. | |
| පද්ධති ප්‍රතික්‍රියාශීලි බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම | 87 | 82 | ආරම්භක නිම කිරීමේ දිනය 2021 ජනවාරි වුවද, එය 2021 අප්‍රේල් වන විට නිම කිරීමට අපේක්ෂිත විය. | ජාත්‍යන්තර ගමන් මත පනවන ලද බාධා නිසා සුපරික්ෂකගේ නිරීක්ෂණයවල ප්‍රමාද වීමට හේතු විය. | - | අනවශ්‍ය පිරිවැය වළක්වා ගැනීමට සැලසුම් කළ ආකාරයට කටයුතු නිම කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටලු

| කාර්ය මණ්ඩලය | තනතුරු සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අනුමත | 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය | | | |
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | 3 | 2 | 1 | ව්‍යාපෘතියේ | ව්‍යාපෘතියේ |
| ගණකාධිකාරී | 1 | 0 | 1 | කටයුතුවලට | මූලා |
| විදුලි අධිකාරී | 8 | 4 | 4 | බලපෑමක් | කටයුතුවල |
| සිවිල් අධිකාරී | 4 | 3 | 1 | නොමැතිව ව්‍යාපෘති | සුමට |
| යාන්ත්‍රික අධිකාරී | 3 | 1 | 2 | කාලපරිච්ඡේදය | ක්‍රියාකාරීත්වය |
| ලේකම් | 1 | 0 | 1 | තුළ ආවරණ | සඳහා ව්‍යාපෘතිය |
| දත්ත සැකසුම්කරු | 1 | 0 | 1 | පදනමින් දැනට | ආරම්භයේදී |
| ඔටෝ කැඩ් නිර්මාණකරු | 1 | 0 | 1 | සේවයේ නියුතු | තනතුරු පිරවිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| රියදුරු | 10 | 9 | 1 | ගණකාධිකාරීගේ සේවය ලබා ගන්නා ලදි | යුතුය. |
| පුහුණු ක්ෂේත්‍ර නිලධාරීන් | 12 | 2 | 10 | | |
| නුපුහුණු ක්ෂේත්‍ර නිලධාරීන් | 4 | 1 | 1<br>3 | | |
| **එකතුව** | **48** | **22** | **26** | | |

### 3.3 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සම්බන්ධ ගැටලු

| මූලික කාර්ය මණ්ඩල තනතුරු | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවා කාලය | වෙනත් ආයතනවල සේවා නියුක්ත බව | සේවයේ නියුතු වන්නේ කොන්ත්‍රාත්/ආවරණ පදනම මතද බව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| ගණකාධිකාරී | අවුරුදු 03 | ඔව් | ආවරණ පදනම | ව්‍යාපෘතියේ කටයුතුවලට බලපෑමක් නොමැතිව ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළද ආවරණ පදනමින් දැනට සේවයේ නියුතු ගණකාධිකාරීගේ සේවය ලබා ගන්නා ලදී. | ව්‍යාපෘතියේ මූල්‍ය කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය සඳහා ව්‍යාපෘතිය ආරම්භයේදී තනතුරු පිරවිය යුතුය. |

### 3.4 ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ගැටලු

| ඉඩම් කොටස් ගණන | | | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| අත්පත් කර ගැනීමට අපේක්ෂිත | 2020 දෙසැම්බර් 31 දිනට අත්පත්කර ගැනීම් | අයිතිය මාරු කිරීම් | | |
| WTG ස්ථාන මිලදී ගැනීම් 1 | | 1 | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය ඉඩම් අමාත්‍යාංශය මගින් එම අරමුණ සඳහා පත්කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරියාගේ පාලනය යටතේ පවතී. ආරම්භයේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ වන්දි මුදල්/ පොළිය තැන්පත් කිරීම සහ | අනාගතයේ සිදුවිය හැකි ගැටුම් මගහරවා ගැනීමට ඉඩම්වල අයිතිය විගස මාරු කල යුතුය. |

LAO විසින් ඉල්ලා සිටින විටදී හැර ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට එම ක්‍රියාවලිය සම්බන්ධයෙන් පාලනයක් නොමැත. අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරියාගේ (මන්නාරම) වගකීම වන අතර (අයිතිය පැවරීමේ සහතිකය නිකුත් කිරීම LAA 42 වගන්තිය) ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ අදාල සියළුම වගන්ති අනුගමනය කිරීමෙන් පසු සිදු කරනු ලැබේ. එසේ නැතහොත් 38ඒ වගන්තිය යටතේ අත්පත් කර ගැනීමෙන් පසුවය. නියමිත ක්‍රමවේද අනුගමනය කිරීමකින් තොරව අයිතිය පැවරීම සිදුකල නොහැකිය. අයිතිය පවරන තෙක් හදිසි පවරා ගැනීමේ වගන්තියේ දින සිට එවැනි ඉඩම් සංවර්ධන කටයුතු සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට පවරන ලද රජයේ ඉඩම් ලෙස සැලකේ.

**විශේෂ වගන්ති යටතේ එවැනි විවිධ අදියරයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.**

35 වගන්තිය 13යි
11 වගන්තිය 7යි
33 වගන්තිය 25යි
15 වගන්තිය 14යි
06 වගන්තිය
නිවැරදි කිරීම් 01යි
රජයට අයත් 10යි